# කෝට්ටේ යුගයේ සන්දේශ තුළින් හෙළිවන අධ්‍යාපනය

## කරි හට්ටිකුලමේ සරණංකර හිමි

කෝට්ටේ යුගය සිංහල සාහිත්‍යයේ ඉතා උද්දීප්තිමත් යුගයක් ලෙස සැලකිය හැකිය. මෙම යුගයේ සාහිත්‍යය දියුණුවීමට හේතු වූයේ එවක රටෙහි පැවති සෞභාග්‍යයත්, සාමයත් ය. සිය වසකට අධික කාලයක් කෝට්ටේ ප්‍රධාන රාජධානිය ලෙස පැවතුණි. මා මේ ලිපියෙන් අදහස් කරන්නේ එවකට කෝට්ටේ රාජ්‍ය සමයෙහි පැවති අධ්‍යාපන තත්ත්වය පිළිබඳව කරුණු ස්වල්පයක් ඉදිරිපත් කිරීමටය. සවන පැරකුම්බා රජතුමාගේ රාජ්‍ය කාලයෙහි ලක්දිව උසස් අධ්‍යාපන තත්ත්වයක් පැවතුන බව එවක රචිත වූ ගිරා සන්දේශ හා හංස සන්දේශ තුළින් අපට වටහාගත හැකිය.

මේ යුගයේදී ඉතා ප්‍රසිද්ධියට පත් විද්‍යාස්ථාන දෙකක් නම් තොටගමුවේ විජයබා පිරිවෙණ හා කැරගල පද්මාවතී පිරිවෙණය. මෙයින් කැරගල පද්මාවතී පිරිවෙණ ආගමික පක්ෂයට මුල්තැන දී කටයුතු කළ ස්ථානයක් විය. ඒ බව හංස සන්දේශයෙහි එන පද්‍යවලින් මනාව පැහැදිළි වේ. එයින් එහි ඉගැන්වෙන විෂය මාලාව දක්වෙයි. හෙරණසික, මූන්සික, සිකවළඳ, කසයින් විරිත, නිස බණවිරිත, තෙරබණ විජම් පෙළ සහ අරුත් සුතුර, පෙලදම් විනය පිටකය යන ආගමික විෂයයනුත්, සංස්කෘත ව්‍යාකරණ චන්දස් අලංකාර කාව්‍ය නාටක ශාස්ත්‍ර යන විෂයයනුත් හදාළ බව සඳහන් වෙයි. මේ විෂය මාලාව දෙස විමසුම් ඇසින් බලන විට කැරගල පද්මාවතී පිරිවෙණ ලෞකික විෂයනට එතරම් සැලකිය යුතු තැනක් දී නොමැති බව පැහැදිළි වේ. එසේ වුවත් තොටගමු විජයබා පිරිවෙනේ ද ධර්ම විනය ඉගැන්වීමට මුල් තැනක් දුන් බව ගිරා සන්දේශයෙහි එන විජයබා පිරිවෙණ වැනුමෙහි මැනවින් දක්වයි. ගිහි පැවිදි දෙපක්ෂයටම මේ සරසවිය විද්‍යා ක්ෂේත්‍රයක් විය. ගිරා සඳෙස්කරු කියන අන්දමට එම විහාරය තුළ තැනින් තැන බණ පොත් පෙරළමින් පාලියෙන් ලියැවුණු ඇතැම් ධර්ම කරුණු පිළිබඳ වාද විවාද කරති. අභිධර්ම විනය සූත්‍ර ආදිය කියවා ගුරුවරුන්ගෙන් අසා දැනගතිති.

කෙසේ වුවත් මෙම විද්‍යාස්ථානය ලෞකික විෂයයන්ගෙන් පරිපූර්ණව පැවති බව කිව හැකිය. වේදය හදාරණ බමුණන්ගෙන් ද එදා මේ විද්‍යාස්ථානය හිස් නොවීය. ඔවුහු විවිධ ආගම් පිළිබඳ කරුණු දක්වා තර්කානුකූලව තම මත සනාථ කරමින් වේදය පිළිබඳව සිය දැනුම දියුණු කර ගත්හ. විවිධ අංශයන්ගෙන් යුක්ත වූ අධ්‍යාපන ක්‍රමයක් යටතේ මෙහි ඇතැම් ශිෂ්‍ය පිරිසක් ජ්‍යෝතිර් විද්‍යාව ද හැදෑරූහ. ගණිතය, පංචාංග ලිත් සකස් කිරීමේ දී උපයෝගී කරගනු ලබන පඛාකර සිදත් හෙවත් සූර්ය සිද්ධාන්ත ගණිත ක්‍රමය ද මෙහි ඉගැන්වූ බැව් සඳහන් වෙයි. හුදෙක් සිද්ධාන්තයට පමණක් වහල් නොවී ද්‍රව්‍ය ආශ්‍රයෙන් පර්යේෂණ පවත්වා දැනුම ලබාදීමේ අධ්‍යාපන ක්‍රමය ද කෝට්ටේ යුගයේ ප්‍රචලිතව පැවති බව කවඩි බෙල්ලන් සහිත නිල් පලසක් ගැන ගිරා සන්දේශයෙහි සඳහන් වන පුවතින් අනාවරණය කරගත හැකිය. වෛද්‍ය විද්‍යාව ද මෙහි ඉගැන්වූ බව සඳහන් වෙයි. අර්ථ ශාස්ත්‍රය විෂයයක් වශයෙන් ඉගැන් වූ අතර සිංහල, පාලි, සංස්කෘත, දෙමළ ආදී විවිධ භාෂා ශාස්ත්‍ර පමණක් නොව නාට්‍ය කලාව ද මෙහි උගන්වා ඇත.

තොටගමුවේ විජයබා පිරිවෙණට ඉතා ප්‍රසිද්ධියක් ලැබුණේ එහි පරිවෙණාධිපති තොටගමුවේ ශ්‍රී රාහුල මහා ස්වාමින්වහන්සේ නිසාය. රාජරාජ මහාමාත්‍යාදීහු මෙහි උගත් බව සඳහන් වෙයි. තොටගමුවේ ශ්‍රී රාහුල ස්වාමීන් වහන්සේගේ දක්ෂතාවයන් ගැන ගිරා සඳෙස් කතුවරයන් කරන විස්තරය අව්‍යාජ වූවක් බව පැහැදිළි වෙයි. කැරගල වනරතන හිමියන් වර්ණනා කරමින් රචිත හංස සන්දේශය තුළින් කෝට්ටේ යුගයේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳව මනා පැහැදිළි විස්තරයක් කර ඇත.

සරණ වැද ගුරුන් කියවා දිනේන් දි   න
පරණ අලුත් පොත් කියවා පතින් ප   න
දරණ කරන ලෙස ඉදගෙන වෙනින් වෙ   න
හෙරණ සික කියති හෙරණෝ තැනින් තැ   න

ආචාර්යවරුන් යටතේ ඔවුන්ගේ අනුදැනුම පිට මේ කාලයේ පිරිවෙන් පාලනය කර ගෙන ගිය අන්දමත්, එසේම මේ කාලයේ පිරිවෙන් අධ්‍යාපනයේ තරමත් අපට අවබෝධ කර ගත හැකිය.

මනහර පොත් රැගෙන පරසිඳු පෙර පට   න
එහි පදරුන් කියන ලෙස නොහැර දැනගෙ   න
සුරගුරුවන් උතුරු දෙම්හයි වනපොති   න
සමහරු රුත් සතර පිරුවනි නොයෙක තැ   න

කෝට්ටේ යුගයේදී ද, අනුරාධපුර යුගයේදී ද විනය පිළිබඳ ලියැවුණු පොත්පත් භාවිතයට ගැනුණු බැවින් භික්ෂූන්වහන්සේගේ විනයට විශේෂ තැනක් ලැබුණු බව හංස සන්දේශය සහ ගිරා සන්දේශය තුළින් ඉතා පැහැදිළි ලෙස දක්වා ඇත. මෙකල භික්ෂු අධ්‍යාපනයට ඇතුළත් කළ තවත් වැදගත් ග්‍රන්ථ දෙකක් පිළිබඳ විස්තර කරන හංසකරු එය දක්වා ඇත්තේ මෙසේය.

එසමන් බදුරු මුනි සදහම් පෙළෙහි ඇ   තී
ලෙස සන් සඳ සමයි ඇ දැනුමට පැව   තී
අසමින් නැර ටීකා විනය සැක නැ   තී
කසයින් විරිත සමහරු වන පොත් කර   තී

මේ අනුව කෝට්ටේ යුගයේදී භික්ෂූන්වහන්සේට මේවා ඉගැන්වූයේ ධර්මය වඩාත් පැහැදිලිව අවබෝධ කර ගැනීමට බව කිව හැකිය. මෙහි මුලින් සඳහන් කළ පරිදි කැරගල පිරිවෙණේ ඉගැන්වූයේ පොතපත පිළිබඳවය. තොටගමුවේ විජයබා පිරිවෙණේ වේදය වැනි දෙයට ලැබුණු තැන මෙහි බෞද්ධ පොතපතට ලැබුණි. එයින් බලාපොරොත්තු වූයේ නියම අන්දමේ සිල්වත් ජීවිතයකට හුරුපුරුදු කිරීමය. බුදුරජාණන්වහන්සේගේ කාලයේ පැවති නොයෙක් මිථ්‍යාදෘෂ්ටීන් පිළිබඳව දැනගෙන ඒවා සම්පූර්ණයෙන් බැහැරකොට පිරිසිදු බුද්ධ ධර්මය ඉගෙන ගැනීමට මහන්සි ගත්හ. මෙයින් විනයට මුල් තැනක් දී ඇත්තේ විනය සාසනයේ ආයුෂ බව දැන සිටි හෙයිනි.

කෙසේ වෙතත් පැරණි කාව්‍ය ශාස්ත්‍ර පිළිබඳව දැනගත හැකි කරුණු ඉතා විරලය. එසේම දඹදෙණි කතිකාවත අනුව භික්ෂූන්වහන්සේට මේ නාට්‍ය ශාස්ත්‍රාදිය ඉගෙනීමට හෝ උගැන්වීම තහනම් විය. කෙසේ වෙතත් කෝට්ටේ යුගයේදී කාව්‍ය නාටකාදියට පිරිවෙණේ අධ්‍යාපනයෙන් එතරම් විශේෂ තැනක් නොලැබුණු බව ගිරා සන්දේශයෙන් ද හෙළිවෙයි. හංස කවියා අනුරාධපුරයේ මහා විහාරය ගැන සඳහන් කරමින්

තුදුටු නොඇසු නම - එහි මහිම හැම මෙලෙසේ
අසා දැක සැක හැර - අනුරපුර මහවෙහෙර දුටුමෙන්
(183 හංස)

යනුවෙන් පවසයි. එයින් ඔහු අදහස් කෙළේ අනුරාධපුර යුගයේදී නිර්මල බුද්ධ ධර්මය ලෙස සැලකුණු ථෙරවාදය ආරක්ෂා කරන්නට උත්සාහ දැරුවන් අතර මහාවිහාරීය භික්ෂූන්වහන්සේට ලැබුණේ ප්‍රථම ස්ථානයකි. කවියා කැරගල පිරිවෙණ, මහාවිහාරය හා සමාන කිරීමෙන් එහි වීසූ භික්ෂූන්වහන්සේ ද නිර්මල බුද්ධ ධර්මය දන්නා බව හඟවයි. එයින් අපට කියෙන්නේ කෝට්ටේ යුගයේ පිහිටි අනෙක් විද්‍යාස්ථානය වූ විජයබා පිරිවෙණ ලෞකික විෂයයන් හදාළ සිසු පිරිසක් සිටි බවත්, එය ග්‍රාමවාසී විද්‍යාස්ථානයක් වූ බැවින් භක්ති මාර්ගයට පදනම් වූ දිවිපෙවෙතක් ගත කිරීම හේතුකොට ගෙන එහි තත්ත්වය වෙනස්වන්නට ඇති බවයි. කෙසේ හෝ වේවා කෝට්ටේ යුගය තුළදී රටේ උසස් සම්භාවනීය උගත් පිරිසක් බිහිවූයේ මේ විද්‍යාස්ථාන දෙකෙන්ම ඇති වූ ශාස්ත්‍රාලෝකය නිසා බව අවිවාදයෙන් පිළිගත හැකිය. සන්දේශකරුවන් තමා ප්‍රිය කරන පුද්ගලයා පිළිබඳව සඳහන් කිරීමේදී අතිශයෝක්තියෙන් යුතුව වර්ණනා කිරීමට ගිය නිසා අපට මේ යුගයේ ලියවුණු සන්දේශ අනුව කැරගල පද්මාවතී පිරිවෙණ හෝ තොටගමු විජයබා පිරිවෙණ යන මේ දෙකින් කුමක් උසස්දැයි පැහැදිලි නිගමනයකට එළඹීමට පුළුවන්කමක් නැත. ඒ නිසා කිවයුත්තේ මේ පිරිවෙන් මගින් ඇති කරවනු ලැබූ අධ්‍යාපනික දියුණුව ඉතා වැදගත් බවයි.

ආශ්‍රිත ග්‍රන්ථ :-


හංස සන්දේශය (ක්‍රිස්ටි ද සිල්වා මහතාගේ සංස්කරණය)

ගිරා සන්දේශය (මකුළුදූවේ පියරතන හිමිගේ සංස්කරණය)

උසස් සිංහල සාහිත්‍යය (ඒ. එස්. බී. තෙන්නකෝන්)

සිංහල සාහිත්‍ය වංශය (පී. බී. සන්නස්ගල)